## කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය -2012

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

2012 දෙසැම්බර් 31 දිනට ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාකෂණ ආයතනයේ මූල්‍ය ප්‍රකාශන 2013 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමෙන් පසුව 2013 මැයි 30 දින කෙටුම්පත් වාර්තාව නිකුත් කරන ලදී. කෙටුම්පත් වාර්තාවේ පෙන්වා දුන් රු. 3,673,838 ක් වූ ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2012 ජුනි 18 දින ඉදිරිපත් කරන ලදි.

#### 1.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අනුග්‍රහයකින්ගෙන් ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු. 22,840 ක ශේෂයක් 2009 වර්ෂයේ සිට අයනොවී පැවතුණු අතර එය අයකර ගැනීමට හෝ ආයතනයේ පොත් වලින් ලියාහැරීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ආ) කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යාපීඨ උද්‍යාන අලංකරණ ව්‍යාපෘතියේදී විශ්වවිද්‍යාලය හා ආයතනය අතර තොරතුරු හුවමාරු වන රැහැනට (Data Cable) හානි සිදුව තිබුණු අතර එය කොන්ත්‍රාත්කරුගේ අතපසුවීමකින් සිදුව තිබුණි. මෙය යථාතත්වයට පත්කිරීම සඳහා ආයතනය විසින් රු.284,000 ක් වැයකර තිබූ අතර අදාල අලාභය කොන්තත්‍රාත්කරුගෙන් කොළඹ විශ්වවිද්‍යාලයට ලැබී තිබුණත් ආයතනයට අයකර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

### 1.2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි<br>මු.රෙ. 371 | අත්තිකාරම් ලබාදීමේදී මාණ්ඩලික සේවයේ නිලධාරීන්ට සීමා විය යුතු වුවත්, අවස්ථා 09 ක දී එකතුව රු.252,023 ක් වූ අත්තිකාරම් තෙවන පාර්ශවය සඳහා ලබාදී තිබුණි. |
| (ආ) මු.රෙ. 1646 හා 2010 දෙසැම්බර් 07 දිනැති අංක 150 දරන ජාතික අයවැය චක්‍රලේඛය | (i) ධාවන සටහන්වල ඉන්ධන තුලනය කිරීම සඳහා ධාවනය කළ දුර පිළිබඳව පරීක්ෂා නොකර , 2012 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කුලී පදනමට ලබාගත් වාහනය සඳහා රු.495,000 ක් වැයකර ඉන්ධන ලීටර් 1393 ක් ලබාදී තිබුණි.<br>(ii) කුලී වාහන ඉවත් කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබාදී තිබියදී ඊට පටහැනි ලෙස ක්‍රියාකරමින් 2011 ඔක්තෝබර් 27 දින කුලී වාහනයක් ලබාගෙන රියදුරු වැටුපද ඇතුළත්ව වාහන කුලිය වශයෙන් මසකට රු.63,000 බැගින් 2012 නොවැම්බර් දක්වා එකතුව රු.819,000 ක් ගෙවා තිබුණි. |
| (ඇ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ලේඛණයක් පවත්වා නොතිබුණි. |
| (ඈ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සියලුම ස්ථාවර වත්කම් සඳහා ආකෘති පත්‍ර 287 ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා නොතිබුණි. |
| (ඉ) ජාතික පුස්තකාල හා ප්‍රලේඛණ සේවා මණ්ඩලයේ අංක 2004/පුස/1 උපදේශණ චක්‍රලේඛයේ 03 ජේදයේ 3.1 උපවගන්තිය | පුස්තකාල පොත් වාර්ෂිකව සමීක්ෂණය කළයුතු වුවත්, පුස්තකාලය ආරම්භයේ පටන් 2013 මැයි 30 දින වන විටත් පොත් පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.34,020,282 ක ඌනතාවයක් ව අතර, ඉකුත් වර්ෂයේ ඊට අනුරූපීව රු.34,711,852 ක ඌනතාවයක් විය. පුනරාවර්තන වියදම් සඳහා රු.37,568,028 ක් වූ රජයේ ප්‍රදානය ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.3,547,746 ක අතිරික්තයක් බවට පත්ව තිබූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු.35,588,306 ක් වූ රජයේ ප්‍රදානය හේතුවෙන් එම වර්ෂයේ අතිරික්තය රු.876,454 ක් වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු.2,671,292 ක වර්ධනයක් ඇතිවීම සඳහා රජයේ ප්‍රදාන රු.1,979,722 කින් වැඩිවීම සහ රු. 994,749 ක ඉපයූ ආදායමේ වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------

### 3.1. කාර්ය සාධනය

-----------------

සමාලෝචිත වර්ෂයේ දී ආයතනය විසින් දර්ශනපති හා දර්ශන විශාරද වශයෙන් පශ්චාත් උපාධි පාඨමාලා 02 ක් ද විද්‍යාපති පාඨමාලා 03 ක් ද පවත්වා තිබුණු අතර, ඒ අනුව පශ්චාත් උපාධි පාඨමාලා 05 ක් පවත්වා තිබුණි.

වසර හයක ශිෂ්‍ය බඳවා ගැනීම් සහ උපාධි ලබා පිටව යෑම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වර්ෂය | ශිෂ්‍ය ලියාපදිංචිය | අවසානයට විභාගයට පෙනී සිටි සංඛ්‍යාව | ඌණ සමත් | අසමත් ශිෂ්‍ය සංඛ්‍යාව | පාඨමාලාව අතහැර ගිය |
|---|---|---|---|---|---|
| 2007 | 12 | 13 | 02 | - | 01 |
| 2008 | 18 | 10 | - | 01 | 02 |
| 2009 | 13 | 12 | 04 | - | 02 |
| 2010 | 20 | 11 | 03 | - | 02 |
| 2011 | 10 | 18 | 04 | 02 | 01 |
| 2012 | 29 | 12 | 01 | - | 01 |

## 3.2. කළමනාකරණ ආකාර්යක්ෂමතා

ආයතන ගොඩනැගිල්ල පවත්වාගෙන යන කොළඹ විශ්වවිද්‍යාලයට අයත් ඉඩම පවරා ගැනීමට 2013 ජුලි වන විටත් කටයුතු කර නොතිබුණි. එම නිසා මූල්‍ය ප්‍රකාශනවල ඉඩම සහ ආයතන ගොඩනැගිල්ලේ වටිනාකම දක්වා නොතිබූ අතර ඒ සම්බන්ධයෙන් හෙළිදරව් කිරීමක්ද කර නොතිබුණි.

## 3.3. නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

(අ) අධි කේන්ද්‍රාප සාරකය (22-BECRMION TC 100 UL TRA CENTRIFUGE) යන්ත්‍රය වසර 03 ක කාලයක සිට හා කේන්ද්‍රාප සාරකය ( J 2 HS- Centrising) යන්ත්‍රය වසර 1 1/2 පමණ සිට ක්‍රියා විරහිතවීම නිසා භාවිතයෙන් ඉවත්කර තිබුණු අතර අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආයතනය විසින් පවත්වාගෙන යන බැංකු ගිණුම් දෙකක රු. 245,796 ක මුදල් ශේෂයක් ඉතා දීර්ඝ කාලයක සිට අක්‍රියව පැවතුණි.

## 4. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට වරින්වර යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

(අ) ස්ථාවර වත්කම්
(ආ) අත්තිකාරම්
(ඇ) පුස්තකාල පරිපාලනය